මාධ්‍ය නිවේදන අංක 11

**මැතිවරණ කොමිෂන් සභාව**

**2021.04.07 දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන තීරණ ගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.**

- මැතිවරණ කොමිෂන් සභාව විසින් සියලුම දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ 2021.04.07 දින සාකච්ඡාවක් පවත්වන ලද අතර එහි දී 2020 ඡන්ද හිමි නාම ලේඛන ප්‍රතිශෝධනය නියමිත කාල වකවානු තුළ අවසන් කිරීම හා 2021 ප්‍රතිශෝධනය ආරම්භ කිරීම, ඡන්ද විමසීම් නීති සංශෝධනවල වර්තමාන ප්‍රගතිය, මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්මට අදාළ යෝජනා ලබා ගැනීම හා ඉදිරි ඡන්ද විමසීම්වල දී දිස්ත්‍රික් මට්ටමේ සංවිධාන කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සිදු කරන ලදී.

- 2021 වර්ෂයේ නව දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීමට අදාළව ලැබී ඇති අයදුම්පත්‍ර පරීක්ෂා කිරීම හා සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම 2021.04.28 දින සිට ආරම්භ කිරීම.

- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගම්පහ දිස්ත්‍රික්කයේ සමගි ජනබල වේගය පක්ෂයේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව පාර්ලිමේන්තු මහ ලේකම් විසින් දන්වා ඇති අතර එම පුරප්පාඩුව සම්පූර්ණ කිරීම පිණිස 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත ප්‍රකාරව තොරතුරු ඉදිරිපත් කරන ලෙස ගම්පහ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත දන්වා යැවීම හා ඒ අනුව අදාළ තැනැත්තාගේ නම ගැසට් පත්‍රයේ පළ කිරීම.

හේ.මු.ති.දි.හේරත්
ලේකම්
මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021.04.08